# කොළඹ විශ්වවිද්‍යාලය
# ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය (විශේෂ උපාධි)
## දෙවන සෙමෙස්තරය - 2017/2018
## SLG 3267 – පුරාතන පද්‍ය සාහිත්‍යය
(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (04) **පමණක්** පිළිතුරු සපයන්න.

---

1. "සිංහල පද්‍ය කාව්‍යය පිළිබඳ එවක පැවති විවිධ සෞන්දර්ය සංකල්ප සීගිරි කුරුටු ගීවලින් පිළිබිඹු වෙයි." විමසන්න.

2. "ප්‍රේම වෘත්තාන්තයකට අවශ්‍ය ආස්වාද ජනනීය සෞන්දර්යාත්මක පරිසරය තුළින් කව්සිළුමිණ ප්‍රේම කාව්‍යයක් බවට පත් කෙරිණි." විමර්ශනයක යෙදෙන්න.

3. "අලංකාරවාදී කාව්‍ය සම්ප්‍රදාය අවිචාරවත්ව යොදා ගැනීම නිසා මුවදෙව්දාවත අනෞචිත්‍ය දෝෂයෙන් දූෂිත විය." මේ අදහස විමසන්න.

4. "මධ්‍යතන සිංහල පද්‍ය සාහිත්‍ය තුළ මයූර සන්දේශය කාව්‍ය බන්ධනය අතින් විස්මය ජනක වූ කෘතියකි." අගයන්න.

5. "සංස්කෘත කාව්‍ය සම්මුතියට අනුකූලව සිංහල සන්දේශ කවීහු ද කාව්‍ය කරණයෙහි නියැලුණහ." සැළලිහිණි සන්දේශය ඇසුරෙන් විමර්ශනයක් කරන්න.

6. "කාව්‍ය ශිල්පය අතින් ගුත්තිල කවියා අන්‍ය පද්‍ය කර්තෘවරුන් අභිභවා යන්නෙකි." විග්‍රහයක යෙදෙන්න.

7. කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍ය සම්ප්‍රදායේ සුවිශේෂතා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

********************